ලබන්නා වූ 2011 නව වර්ෂය වගේම නව දශකයත් "ගී සඳලුව" කියවන පාඨක හැමෝම ඇතුලු සෑම සියලු දෙනාටමත් ශුභ නව වසරක් වගේම ශුභ දශකයක් වේවා ! කියලා ප්‍රාර්ථනා කරනවා.

ලබන අවුරුද්දේ මෙල්බර්න් නුවර සින්දු අහන අපට මුලින්ම අහන්න ලැබෙන සුභාරංචිය තමයි ප්‍රවීණ සංගීතවේදී වික්ටර් රත්නායකයන්ගේ සංචාරය. දශක ගණනාවක් තිස්සේ තමන් ආව ගමනේදී අමතක කරන්නට බැරි හැත්තෑව දශකයේ සින්දු ගොන්නකුත් එකතු කරගෙන එන මේ සංචාරය ලබන මේ නව දශකයට හොඳ පෙර නිමිත්තක්.




# වන පස මල



මේ හේතුව නිසාම වික්ටර් රත්නායකයන්ව දුරකථනයෙන් සම්බන්ධ කරගන්නට අපි හිතුවා.

"පහු ගිය දවස්වල මං ලංකාවේ හිටියෙ නෑ සිසිර" ලන්ඩන් වල තිබුණ ප්‍රසංගයට ගියානේ ........." ඒ හන්දම ආවට පස්සෙත් අතපහු වුණ වැඩවල යෙදෙන්න වුණා. දැන් ඉතින් අපි ඔය පැත්තේ එන්නයි සූදානම ......." රත්නායකයන් දුරකථනයෙන් අප එක්ක කතාවකට මුල පිරුවා.

"මේ වතාවෙ මම මෙල්බර්න් නුවරට එන්නේ ටිකක් වෙනස් විදිහේ ප්‍රසංගයක් කරන්න හිතාගෙන. ඇත්තම ට මගේ හොඳ රසිකයෙක් තමයි ගාමිණි කරව්දෙනිය මහත්තයා. ගාමිණියි, ඒ සංවිධායකයින්ටයි ඕන කළේ හැත්තෑවේ දශකයේ අපි අතින් කෙරුණ ගීත එකතුවක් අළුත් දශකයට ගැලපෙන විදියකට ඉදිරිපත් කරන්න. එකෙන් කියවෙන්නෙ ගීත වෙනස් කරනවාය කියන එක නම් නෙවෙයි. "ස" ප්‍රසංගයට වඩා වෙනස් මුහුණුවරකින් ඉදිරිපත් කරනවාය කියන එකයි. "ස" ප්‍රසංගයේ මතකයන් අපේ රසිකයින්ට අළුත් කරවන එකත් එක අරමුණක්. ඔය හන්දම අපේ ප්‍රසංගය නම් කරලා තියෙන්නේ "ස, වික්ටර්, ඔබ හා මම" කියලා. මේ හැම දෙයක්ම එකම දෙයක් විදියට ප්‍රසංගය දුට රසිකයන්ට දැනේවි."

"අනික් වැදගත් කාරණය තමයි මෙල්බර්න් ආර්ට්ස් සෙන්ටර් එකේ කෙරෙන මුල්ම ඒක පුද්ගල සිංහල සංගීත ප්‍රසංගයයි මේ. මීට කලින් වතාවක මේ ශාලාවේදී ඉදිරිපත් කරපු "සුරස සුසර" ප්‍රසංගයට අමරදේව තුමා, නන්ද මාලනී, රෝහණ වීරසිංහ එක්ක මමත් සහභාගී වුණා."

මුල්ම වතාවට මේ දැවැන්ත ශාලාවේ සිංහල අපේ දෙයක් කෙරුණෙ 2004 අවුරුද්දේ. ඒ "රන් සවර ධාරා" ගීත ප්‍රසංගය ඉදිරිපත් කලේ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සංගමය.

"මේ ප්‍රසංගයේදී තවත් වැදගත් කටයුත්තක් කෙරෙනවා. මුල්ම වතාවට මම ලංකාවෙන් පිට රටකදී මගේ ගීත එකතුවක් එළි දක්වන්නට කටයුතු සූදනම් කරලයි තියෙන්නේ අමෙරිකාවේ ලොස් ඇන්ජලීස්වල ඉන්න ආචාර්ය ඩෙනිල් ප්‍රියංක මහත්මයා තමයි මේ ගීත එකතුවේ තියෙන ගීත දසයම රචනා කළේ. ඒ මහත්මයත් අමෙරිකාවේ ඉඳන් මෙල්බර්න් වලට ඇවිත් එදට මේ කටයුත්තට සහභාගී වෙනවා."

කලාකරුවෙකුට පහළවෙන වටිනාම නිධානය තමයි හොඳ රසිකයින්. තමන්ගේ ගීත එකතුවක් එළිදක්වන්නට වික්ටර් රත්නායකයන් මෙල්බර්න් නුවර තෝරාගන්නට හේතුව තමන්ගේ හොඳ රසිකයින් පිරිසක් මෙල්බර්න් නුවර ඉන්න නිසාය කියලයි අපට හිතෙන්නෙ. රත්නායකයන් වාගේ ප්‍රවීණයෙක් තමන්ගේ රසිකයින් වෙනුවෙන් කරන විශේෂ සැළකිල්ලක් නෙවෙයි ද මේ? අපේ රසිකත්වය අගය කරන එක ගැන අපටත් සතුටු වෙන්න පුලුවන් නේද එදට ?

අපි සංගත තැටිය ගැන උනන්දු වුණා.

"සංගත තැටියේ නම "වන පස මල". යුග ගායනා කරන්නේ උරේෂා රවිහාරී කියන අපේ යො-වුන් ගායන ශිල්පිනිය. සංගීත සංයෝජනය කළේ ජයන්ත රත්නායක. හැම ගීතයකම තනුවයි සංගීතයයි නිර්මාණය කළේ මම යි. ඉතින් අපේ අළුත් නිර්මාණ රස විඳලා බලන්න."

වික්ටර් රත්නායකයන් කෙටියෙන් සංගත තැටිය ගැන අදහස් දැක්වුවා. ඉතාම අවිවේකී මොහොතක අප එක්ක දුරකථනයෙන් එක් වීම ගැන "සන්නස" වෙනුවෙන් අප රත්නායකයන්ට ස්තුතිවන්ත වුණා.

උරේෂා රවිහාරී සමඟ ගැයු තේමා ගීයේ පද පෙළ පාඨකයින් මේ විදියට සටහන් තබනවා.

පිරිමි:
වන පස මල රෑ සඳ නැඟෙනා
සිතුමිණ සිත් ගැඹරට වැටෙනා
නුඹගෙන් ලද සෙනෙහස සපුරා
අසනිය මල් හදවත සැළුණා

ගැහැණු:
පෑයු තරු ගිරි හිස සිපිනා
සෑ බිම අප පිය නැගු පෙරදා
ඒ සඳ ඇයි යළි මතු නොවෙනා
ඔබ සිහි වී නෙත් යුග තෙමුණා

පිරිමි:
දිය කඳුර ද කෙම් බිම සදනා
ළඳ සුදු මුදු හසරැළි දරනා
ඔබෙ සියුමැලි තෙපුලක රඳනා
සුවහස් සැනසිලි සුව රැඳුනා

ගැහැණු:
රෑ සුළඟට පාවෙන සසැලී
ඔබ පිළිබඳ සිතුවිලි මතු වී
අවිහිංසක සිනහව සොයමී
මේ රෑ වන පියසේ තනි වී




මේ විසල් දෙවොල් බිම අගුපිලක කෙලවරක
මද අඳුර මැද සැඟව ගයමි මම ජීවිතය

මදනලෙහි අග රැඳුන ඔය සිඟිති රැලි පොඩිති
සිනා ගන්වන්නේ මමයි දෙවොල් බිම සරසන්න

රෑ අහස තරු කැකුළු ඉඟි මරන රිද්මයේ
රහස මගෙ ගීතයයි ඔබ නමින් මා ගයන

ජීවිතය විකසිතව ගීතයේ ස්වර වෙයි
මිදී යයි අනායාසයෙන්
පාව යනු මිස ගීතයක් වී
දෙවොල් බිම සිසාරා
නොමැත අන් අරමුණක්
මේ දුබල දුහුවිලි බිඳට

තරු නිදන සඳ නොමැති රෑ
අඳුරු දෙවොලේ
නිහරු මැදියම් වන්දනාවේ
මොහොතෙදීවත් සන් කරනු මැන මට
නැගෙන්නට රැදෙන්නට
ගයන්නට ඔබ අසල

පිරිමැදී හිමිදිරි මද නලින්
සර නැගෙන කල ස්වර්ණ වීණාවේ තත්
සන් කරනු මැන මේ දුහුවිලි බිඳට
නැගෙන්නට රැදෙන්නට
ඔබේ සුසුදු වූ දෙපාමුල
ඉපිල යන්නට ඒ මාධූර්යයෙන්

I am here to sing thee songs. In this hall of thine I have a corner seat.

In thy world I have no work to do; my useless life can only break out in tunes without a purpose.

When the hour strikes for thy silent worship at the dark temple of midnight, command me, my master, to stand before thee to sing.

When in the morning air the golden harp is tuned, honour me, commanding my presence.

*රබින්ද්‍රනාත් තාගෝර්යන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු